64017

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2567 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2020/2021/2022(2023) 02 S**

**(02) බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**

පැය තුනයි

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) යම්කිසි හේතුවක් නිසා තවත් ධර්මයන් ඇතිවීම පිළිබඳව දේශනා කළ මූලික ඉගැන්වීම නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඉහත (i) හි දැක්වෙන මූලික ඉගැන්වීමට අයත් ක්‍රමවේද හතර ලියා දක්වන්න.

(ආ) ඉහත (ii) (අ) හි සඳහන් ක්‍රමවේද හතර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මිනිසා ජරා මරණයන්ට ගොදුරු වන්නේ කුමක් හෙයින් ද යන ප්‍රශ්නය බෝසත්තුමා තුළ පහළ වූයේ කවර අවධියක කුමන අවස්ථාවක දැයි පෙන්වා දෙන්න.

(ආ) සත්වයා සසර සැරි සැරීමට අවුලෙන් අවුලට පත්වීමට හේතුව පැහැදිලි කෙරෙන දීඝනිකායේ ඇතුළත් සූත්‍රයේ නම ලියන්න. (ලකුණු 06 යි)

(iv) සමාජගත ගැටලු විසඳා ගැනීමට ඉහත (i) හි සඳහන් ධර්මතාව උපකාරීවන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

2. (i) චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) චතුරාර්ය සත්‍ය ධර්ම අතුරින් දෙකක් හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ක්ලේශ හා ස්කන්ධ පරිනිර්වාණයන් සඳහා භාවිත කරන පරිනිර්වාණ අවස්ථා දෙක නම් කරන්න.

(ආ) ඉහත (iii) (අ) හි දැක්වෙන අවස්ථා දෙකෙහි වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) "අන්තවාදී නොවී කටයුතු කිරීමේ වැදගත්කම මධ්‍යම ප්‍රතිපදා (මජ්ඣිමා පටිපදා) මාර්ගයෙන් ඉදිරිපත් කරයි." මෙම ප්‍රකාශයේ සත්‍යතාවය අනාවරණය කරන්න. (ලකුණු 08 යි)

3. (i) ත්‍රි ලක්ෂණය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ත්‍රි ලක්ෂණයන්ගෙන් දෙකක් හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ස්කන්ධ පංචකය දක්වන්න.

(ආ) 'උප්පාද' - 'වය' යන පද දෙකෙහි අර්ථය සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝකය පිළිබඳව යථාවබෝධය සඳහා මෙම ලක්ෂණ ඉවහල් කරගත හැකි අයුරු ලියා දක්වන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

**4.** (i) 'සචේතනික ක්‍රියා' සහ 'අචේතනික ක්‍රියා' යන පදවල අර්ථය දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඉහත (i) හි දැක්වූ ක්‍රියා අතුරින් කර්මය බවට පත් වන්නේ කවරක් දැයි ලියන්න.

(ආ) ඉහත (i) හි දැක්වූ ක්‍රියාවල බෙදීම් දෙක නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'විපාක දෙන කාලය අනුව කර්මය සතර වැදෑරුම් වේ.' ඒවා නම් කරන්න.

(ආ) ඉහත (iii) (අ) හි දැක්වූ ප්‍රභේදවලින් දෙකක් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iv) (අ) ත්‍රි විද්‍යා අතුරින් පුනර්භවයක් ඇතැයි සනාථ වන ඥාණ දෙක නම් කරන්න.

(ආ) කර්මය හා පුනර්භවය අතර ඇති සම්බන්ධතාව හෙළි කරන්න. (ලකුණු 08 යි)

## II කොටස

**5.** (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන සම්මා සති සහ සම්මා සමාධි යන අංග දෙකට උපයෝගීවන භාවනාව නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඉහත (i) හි සඳහන් භාවනාව හඳුන්වන සමානවාචී පද දෙකක් ලියන්න.

(ආ) ඉහත (i) හි සඳහන් භාවනාව වැඩීමෙන් ලද හැකි ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ඉහත (i) හි සඳහන් භාවනාවට අයත් කර්මස්ථාන සංඛ්‍යාව කොපමණ දැයි දක්වන්න.

(ආ) ඉහත (iii) (අ) හි දැක්වූ කර්මස්ථාන නම් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) 'මානසික නීරෝගී සුවතාව ආරක්ෂා කරගැනීමට භාවනාව මාර්ගයක් වශයෙන් ගත හැකි ය.' හේතු දක්වමින් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 08 යි)

**6.** (i) සතර පරමාර්ථ ධර්ම නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මාර්ග හා ඵල සිත් අට පිළිවෙළින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් කළ සිත්වලින් ප්‍රහාණය වන සංයෝජන ධර්ම වෙන් වශයෙන් දක්වන්න. (ලකුණු 06 යි)

(iv) (අ) සංයෝජන ධර්ම ප්‍රහීණ කළ උත්තමයන් තිදෙනා නම් කරන්න.

(ආ) එම උත්තමයන් තිදෙනා අතුරින් බුදුන් වහන්සේගේ දවස පහළ නොවන්නේ කවර උත්තමයෙක් දැයි සඳහන් කරන්න. (ලකුණු 08 යි)

**7.** (i) සිත භූමි වශයෙන් සිවු වැදෑරුම් වේ. එම භූමි හතර නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සිත් අසූනවය එකී භූමිවලට අදාළවන පරිද්දෙන් බෙදා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) අභිධර්මයේ දී හේතු නමින් දක්වන කුසලාකුසල ධර්ම වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(iv) (අ) අකුසල, අහේතුක, සෝභන යන මේවා අයත්වන සිත් ගණය හඳුන්වන නම ලියන්න.

(ආ) ඉහත (iv) (අ) හි සඳහන් සිත්වලට අදාළව ඒවා උපදින ස්ථාන සඳහන් කරන්න. (ලකුණු 08 යි)

## III කොටස

**8.** පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

(i) ඵේණූපමං කායමිමං විදිත්වා
මරීචිධම්මං අභිසම්බුධානෝ
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡේ.

(ii) මුහුත්තමපි චේ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා.

(iii) බහුම්පි චේ සහිතං භාසමානෝ
න තක්කරෝ හෝති නරෝ පමත්තෝ
ගෝපෝව ගාවෝ ගණයං පරේසං
න භාගවා සාමඤ්ඤස්ස හෝති.

(iv) යං යං ජනපදං යාති නිගමේ රාජධානියෝ
සබ්බත්ථ පූජිතෝ හෝති යෝ මිත්තානං න දූභති. (ලකුණු 05 × 4 = 20 යි)

[ 3 වැනි පිටුව බලන්න.

**9.** පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

(i) විරූපක්ඛෙහි මේ මෙත්තං
මෙත්තං ඒරාපථේහි මේ
ඡබ්‍යාපුත්තේහි මේ මෙත්තං
මෙත්තං කණ්හාගෝතමකේහි ච.

(ii) සක්කත්වා සක්කතෝ හෝති
ගරු හෝති සගාරවෝ
වණ්ණකිත්තිභතෝ හෝති
යෝ මිත්තානං න දූහති.

(iii) මා මං අපාදකෝ හිංසි
මා මං හිංසි දිපාදකෝ
මා මං චතුප්පදෝ හිංසි
මා මං හිංසි බහුප්පදෝ.

(iv) දරිතෝ පබ්බතාතෝ වා
රුක්ඛාතෝ පතිතෝ නරෝ
චුතෝ පතිට්ඨං ලභති
යෝ මිත්තානං න දූහති.

(ලකුණු 05 × 4 = 20 යි)

**10.** පහත දැක්වෙන පාලි පාඨ සිංහලට නගන්න.

(i) ඉදමවෝච භගවා, අත්තමනා තේ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

(ii) තේන හි දේවි, අන්තෝ පරිවේණේ ආසන්නමරණෝ, සාමණේරෝ අත්ථි තේන සද්ධිං මන්තේහීති ආහ.

(iii) තතෝ තස්මිංයේව වස්සේ විහාරදේවි අඤ්ඤං පුත්තං විජායි.

(iv) පුත්ත, කිමත්ථං හත්ථපාදේ පසාරෙත්වා සුඛේන න නිපජ්ජසි.

(v) කාකවණ්ණතිස්ස මහාරාජා කිර විහාරදේවියා සද්ධිං රෝහණේ රජ්ජං කාරෙන්තෝ අනෝපමං මහාදානං පවත්තෙන්තෝ මහාගාමේ පටිවසති.

(ලකුණු 04 × 5 = 20 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library